# සීමාසහිත
# බන්ධනාගාර දෙපාර්තමේන්තු
# නිලධාරීන්ගේ බෞද්ධ සංගමය
# ව්‍යවස්ථාව

# සීමාසහිත බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ගේ බෞද්ධ සංගමයේ ව්‍යවස්ථාව

1. හැඳින්වීම
සීමාසහිත බන්ධනාගාර දෙපාර්තමේන්තු නිලධාරීන්ගේ බෞද්ධ සංගමය හිටපු බන්ධනාගාර කොමසාරිස් ජේ.පී.දෙල්ගොඩ මහතාගේ මූලිකත්වයෙන් 1977 වර්ෂයේ දී ආරම්භ කරන ලදි.

2. නම
" **සීමාසහිත බන්ධනාගාර දෙපාර්තමේන්තු නිලධාරීන්ගේ බෞද්ධ සංගමය**"

3. අරමුණ
බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ සේවය කරන නිලධාරීන්ගේ බෞද්ධාගමික කටයුතු ප්‍රවර්ධනය, මගපෙන්වීම, අධ්‍යාත්මික සංවර්ධනය හා අවශ්‍ය සම්පත් දායකත්වය ලබා දීම.

4. සාමාන්‍ය සාමාජිකත්වය
බන්ධනාගාර සේවයේ නියුතු සෑම නිලධාරියෙකුම තම සේවා කාලය තුල මෙම සමිතියේ නිත්‍ය සාමාජිකයෙකු ලෙස සලකනු ලබයි.

5. යාවජීව සාමාජිකත්වය
යාවජීව සාමාජිකත්වය ප්‍රධානය කිරීම සංගමයේ මහා සභාවට විවෘතව ඇති අතර බෞද්ධ සංගමයේ දැනට සිටින හෝ විශ්‍රාමික ඕනෑම දෙපාර්තමේන්තු සේවකයෙකුට සමිතියේ උන්නතිය උදෙසා තමා කරන ලද සුවිශේෂී වූ සේවය පිලිබඳව සලකා බලා,මහා සභාවට ඉදිරිපත් කරන යෝජනා ස්ථිර කිරීමකින් යාවජීව සාමාජිකත්වය ලබා දිය හැක.

6. ගරු සාමාජිකත්වය
විශ්‍රාමික බන්ධනාගාර නිලධාරියෙකුට හෝ වෙනත් බන්ධනාගාර නිලධාරියෙකුට අයදුම්පතක් ඉදිරිපත් කිරීමෙන් පසු මහා සභාවට ඉදිරිපත් කරන යෝජනා ස්ථිර කිරීමකින් ගරු සමාජිකත්වය ලබා දිය හැක.

7. සාමාජිකත්වය ඉවත් කිරීම
බන්ධනාගාර සේවය අවසන් වන නිලධාරියෙකුගේ සාමාජිකත්වය එම අවස්ථාවේ සිට අවසන් වේ. වැඩ තහනමකට යටත්ව සිටින නිලධාරියෙකුට බෞද්ධ සංගමයේ කිසිඳු පහසුකමක් නොලැබෙන අතර මෙය වැඩ තහනමට ලක්ව සිටින කාලයට පමණක් වලංගු වේ. සංගමයේ තනතුරක් දරණ සාමාජිකයෙකු වැඩ තහනමකට ලක් වී ඇත්නම් එම කාලය තුල එම තනතුරේ කටයුතු කිරීම තහනම් වන අතර එම පුරප්පාඩුව තාවකාලිකව පිරවිය යුතුය. යාවජීව හෝ ගරු සමාජිකත්වය ඔහුගේ හෝ ඇයගේ මරණින් පසු විධායක සභාව මගින් හෝ කාරක සභාව ගන්නා තීරණ අනුව ඉවත් කළ හැකිය.

8. සාමාජිකත්වය අත්හිටුවීම
බන්ධනාගාර බෞද්ධ සංගමය මගින් සාමාජිකයෙකුගේ සාමාජිකත්වය අත්හිටුවිය හැකි අතර සංගමය මගින් පිරිනැමෙන පහසුකම් හෝ සංගමය නියෝජනය කිරීම, සංගමයේ විධායක සභාව ගන්නා තීරණ මත අත්හිටුවිය හැක.

9. නිලධාරී මණ්ඩලය
ගරු සභාපති, ගරු උප සභාපති, ගරු ප්‍රධාන ලේකම්, ගරු උප ලේකම්, ගරු භාණ්ඩාගාරික, වශයෙන් සංගමයේ ප්‍රධාන තනතුරු බෙදී යන අතර කාරක සභිකයින් හා ගිණුම් පරීක්ෂකවරු වශයෙන් අනෙකුත් තනතුරු බෙදී යනු ඇත.

| | | |
|---|---|---|
| 9.1 ගරු සභාපති | - | බන්ධනාගාර කොමසාරිස් ජනරාල් නිල බලයෙන් පත්වෙනු ලබයි. |
| 9.2 උපසභාපතිවරුන් | - | බන්ධනාගාර කොමසාරිස්වරුන් අතරින් දෙදෙනෙක් යෝජනා ස්ථිරත්වයෙන් පත්කර ගත යුතු වේ. |
| 9.3 ප්‍රධාන ලේකම් | - | ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික නිළධාරීන් අතුරින් නිළධාරියෙකු යෝජනා ස්ථිරත්වයෙන් පත්කර ගත යුතුවේ. |
| 9.4 උප ලේකම් | - | යෝජනා ස්ථිරත්වයෙන් පත් කළ යුතුය. |
| 9.5 ගරු භාණ්ඩාගාරික | - | බන්ධනාගාර අධිකාරිවරයෙකු හෝ සහකාර අධිකාරී වරයෙකු යෝජනා ස්ථිරත්වයෙන් පත් කර ගත යුතුය. |
| 9.6 ගිණුම් පරීක්ෂකවරු | - | ගිණුම් පරීක්ෂකවරු දෙදෙනෙක් මහා සභාවේ යෝජනා ස්ථිරත්වයෙන් පත්කරගත යුතු වේ.ජේලර් තනතුරෙන් ඉහල නිලධාරීන් විය යුතුය. |
| 9.7 කාරක සභාව | - | සෑම බන්ධනාගාර ආයතනයකම අධිකාරීවරයා සහ යෝජනා ස්ථිරත්වයෙන් නම්කරනු ලබන තවත් සාමාජිකයෙක් වශයෙන් සියළුම බන්ධනාගාර නියෝජනය වන පරිදි කාරක සභාව සමන්විත විය යුතුය. |
| 9.8 ප්‍රධාන අනුශාසක | - | මහ සභා රැස්වීමේ දී යෝජනා ස්ථිරත්වයෙන් සුදුසු ස්වාමීන් වහන්සේ නමක් තොරා පත් කර ගත යුතුය. |

10. සැලකිය යුතුයි.

ඉහත සියළු තනතුරුවල නිල කාලය ඊලග වාර්ෂික මහාසභා රැස්වීම දක්වා වලංගු වන අතර, මෙම වාර්ෂික සභා වාරයන් දෙක තුල යම් පරප්පාඩුවක් හෝ තනතුරකින් ඉවත් කිරීමක් සිදු වුවහොත් එම තනතුර කාරක සභාව විසින් පිරවිය යුතුය. යම් තනතුරක් සඳහා එක් අයෙකුට වැඩි පිරිසක් ඉදිරිපත් වන්නේ නම්, ඡන්දයකින් තෝරා පත් කර ගත යුතුය.

11. පරිපාලනය

බෞද්ධ සංගමයේ සියළුම කටයුතු සඳහා මග පෙන්වීම සංගමයේ විධායක සභාව හා කාරක සභාව මඟින් සිදු කල යුතුය. එසේම යම් කඩිනම් තීරණ ගැනීමට අවශ්‍ය අවස්ථාවන්හි දී ගරු සභාපතිවරයා විසින් විධායක සභා රැස්වීමක් කැඳවා අදාල කඩිනම් තීරණ ගැනීමට පියවර යුතුය.

12. විධායක සභාව

- ගරු සභාපති
- ගරු ප්‍රධාන ලේකම්
- ගරු භාණ්ඩාගාරික
- ගරු උප සභාපතිවරු
- ගරු උප ලේකම්
- කාරක සභික සාමාජික තුනක්

13. විධායක සභාවේ බලතල හා කාර්යභාරය

13.1 කාරක සභාව මගින් අනුමත කරන ලද හෝ බලය පවරන ලද කටයුතු සඳහා තීරණ ගැනීම හා වියදම් අනුමැතිය ලබා දීම.

13.2 කාරක සභාවේ අනුමැතියට යටත්ව විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා තීරණ ගැනීම හා වියදම් දැරීමට අනුමැතිය ලබාදීම.

13.3 කාරක සභාව කැඳවීමට ප්‍රමාණවත් කාලයක් නොමැති අවස්ථාවන්හිදී විධායක සභාව මගින් අදාල කරුණ සම්බන්ධයෙන් අනුමැතිය ලබා දීම මගින්, එම වියදම් දැරීමට හැකි වන අතර ඒ පිළිබඳව එළඹෙන කාරක සභාවට වාර්තා කල යුතුය.

13.4 ඕනෑම කරුණක් සඳහා විධායක සභාව විසින් ගනු ලබන තීරණය අවසන් තීරණය වේ.

13.5 සංගමය වෙනුවෙන් සහතික නිකුත් කිරීමේ බලය විධායක සභාව සතු වේ.

14. භාණ්ඩාගාරිකගේ කාර්යභාරය

14.1 බෞද්ධ සංගමයට ලැබෙන සියළුම මුදල් සහ සියළුම වියදම් පිළිබඳව සත්‍ය ගිණුම් ඔහු විසින් පවත්වා ගත යුතුය.

14.2 ඔහු විසින් නියමාකාරයෙන් විගණනය කරන ලද ලාභ අලාභ ගිණුම සහ ශේෂ පත්‍රය වාර්ෂික මහා සභා රැස්වීමේදී සෑම අවුරුද්දකම පෙබරවාරි මස ඉදිරිපත් කල යුතුය. මෙම ගිණුම් වාර්තාව ජනවාරි 01 සිට දෙසැම්බර් මස 31 දක්වා විය යුතුය.

15. මූල්‍ය, බැංකු කටයුතු සහ ආයෝජන

15.1. බෞද්ධ සංගමයේ මූල්‍ය වර්ෂය වනුයේ සාමාන්‍ය කැලැන්ඩර් වර්ෂයයි.

15.2. බෞද්ධ සංගමයට අයිති සියළුම මුදල් බැංකුවේ තැන්පත්කල යුතු අතර එම තැන්පතු විධායක සභාව විසින් අනුමත කල යුතුය. සියළුම ගෙවීම් හැකිතාක් චෙක්පත් මගින් සිදු කල යුතුය.

15.3. සෑම චෙක්පතක්ම පුද්ගලයින් දෙදෙනෙකු අත්සන් කල යුතු අතර එක් අත්සනක් A කාණ්ඩයේ සහ අනෙක් අත්සන B කාණ්ඩයෙන් විය යුතුය

- A කාණ්ඩය - සභාපති ( සභාපති නොමැති විට උප සභාපති)
- B කාණ්ඩය - ගරු භාණ්ඩාගාරික

16. සංගමයේ අරමුදල

16.1.සංගමයේ සාමාජිකයින්ගෙන් ලැබෙන මාසික සාමාජික මුදල් හා වෙනත් පරිත්‍යාගශීලීන්ගෙන් ලැබෙන නිත්‍යානුකූල පරිත්‍යාග,සංගමයට අයත් නිවාඩු නිකේතන වලින් ලැබෙන ආදායම් වලින් සමන්විත විය යුතුය. සංගමයේ සාමාජික ගාස්තුව මේ වනවිට මාසිකව රු.30.00 ක් වන අතර ,වාර්ෂික මහා සභා රැස්වීමේදී යෝජනා ස්ථිරත්වයෙන් ගන්නා තීරණ අනුව සාමාජික ගාස්තුව වෙනස් කල හැක.

16.2 එසේම සංගමයට අයත් කතරගම කේතුමතී නිවාඩු නිකේතනයෙන් සහ නුවරඑළිය නිවාඩු නිකේතනයෙන් ලැබෙන ආදායම් එම නිවාඩු නිකේතන කලමණාකරුවන් විසින් මාසිකව සංගමයේ අරමුදල වෙත බැරකිරීමට හා ඊට අදාල මාසික වාර්තා සංගමයේ භාන්ඩාගාරික වෙත එවීමට කටයුතු කල යුතුය.

16.3 බෞද්ධ සංගමය මගින් පවත්වාගෙන යනු ලබන නිවාඩු නිකේතනවල කාමර මිලගණන් තීරණය කිරීම කාරක සභා අනුමැතිය මත සිදුකල හැකිය.

16.4 එසේම නව ව්‍යාපෘති ආරම්භ කරන්නේ නම් කාරක සභාවේ අනුමත කරන ලද යෝජනාවක් මහා සභා රැස්වීමට ඉදිරිපත් කර අනුමැතිය ලබාගත යුතුය.

17. විගණනය

මහා සභාව විසින් තීරණය කරන අවස්ථාවකදී ගිණුම් පිළිබඳ දැනුම ඇති නිලධාරීන් දෙදෙනෙකු මගින් හෝ බාහිර ආයතනයක් මගින් විගණනය සිදුකල යුතුය.

18. බලය පැවරීම

විධායක සභාව විසින් හෝ කාරක සභාව මගින් ඔවුන්ගේ බලය ඔවුනට සුදුසු යැයි හැගෙන සාමාජිකයෙකු හෝ සාමාජිකයින් සිටින උප කමිටුවකට පැවරිය හැකිය. ඕනෑම උප කමිටුවක් වෙත පවරණු ලැබූ එම බලය පවතින කාලය සහ එහි ක්‍රියා කාරීත්වය ,එම විශේෂ කටයුත්ත පැවැත්වෙන කාලය සඳහා බල පැවැත්වෙනු ඇත.

19. අවම සාමාජික සංඛ්‍යාව

වාර්ෂික මහා සභා රැස්වීම සඳහා අවම සාමාජික සංඛ්‍යාව 50 ක් වත් විය යුතු අතර ,විධායක සභා රැස්වීම් සඳහා අවම සාමාජික සංඛ්‍යාව 05 ක් හා, කාරක සභා රැස්වීමක් සඳහා අවම සාමාජික සංඛ්‍යාව 10 ක් වත් විය යුතුය.

20. වාර්ෂික මහා සභා රැස්වීම / කාරක සභා රැස්වීම.

20.1 වාර්ෂික මහා සභා රැස්වීම සෑම වසරකම මාර්තු 31 දිනට පෙර පැවැත්විය යුතු අතර,මෙම රැස්වීම පිළිබඳව සාමාජිකයින් වෙත කරනු ලබන දැන්වීම ගරු ලේකම් විසින් සති දෙකකටවත් පෙර සිදුකල යුතුය.එසේම මහා සභාරැස්වීමට සති දෙකකටවත් පෙර විගණනය කරන ලද ගිණුම් වාර්තාවේ පිටපතක්,පසුගිය මහා සභා රැස්වීම් වාර්තාවේ පිටපතක් හා මහා සභා රැස්වීමේ න්‍යාය පත්‍රය සාමාජිකයින් අතර බෙදා හැරිය යුතුය.

20.2 කාරක සභා රැස්වීමක් සෑම මාස 04 කට වරක්ම පැවැත්විය යුතුය.

21. ව්‍යවස්ථා සංශෝධන

සංශෝධන පිළිබඳ යෝජනා ගරු ප්‍රධාන ලේකම් වෙත අදාල රැස්වීමට අවම වශයෙන් සති දෙකකට පෙර ලැබිය යුතු අතර එම සංශෝධන පිළිබඳව ක්‍රියාකරනුයේ ගරු සභාපති වරයාගේ අවසරයෙන් පමණි.

22. සාමාජිකයින් සඳහා ප්‍රතිලාභ

බෞද්ධ සංගමය මගින් ආරම්භකර පවත්වාගෙන යන නුවරඑළිය හා කතරගම නිවාඩු නිකේතන වල කාමර පහසුකම් සමිතියේ සාමාජිකයින්ට ආයතන අධිකාරි වෙතින් ලබාගත් සාමාජිකත්වය තහවුරු කරන ලද ලිපියක් ඉදිරිපත් කිරීම මගින් සහනදායී මිලට වර්ෂයකට කාමර 03 ක් වශයෙන් ලබාදීම.

23. ප්‍රාදේශීය සංගම් / අනු සංගම්

23.1 බන්ධනාගාර ආයතන විසින් පිහිටුවාගන්නා ප්‍රාදේශීය සංගම් විධිමත් ලෙස ව්‍යවස්ථාවක් සම්මත කරගෙන පිහිටුවා තිබිය යුතුය. එම සංගම්වලට ස්වාධීනව කටයුතු කළ හැකි අතර සංගම් මගින් ආයතනයේ නිළධාරීන්ගේ බෞද්ධාගමික කටයුතු හා සුභසාධන කටයුතු සිදු කිරීමට ද කටයුතු කළ යුතුය. එසේම ගිණුම් වාර්තා නිසි ලෙස පවත්වා ගත යුතුය.

23.2 ප්‍රාදේශීය සංගම් වල ගිණුම් කටයුතු හෝ අනෙකුත් කටයුතු පිළිබඳව පරීක්ෂා කිරීමට විධායක සභාවේ හෝ කාරක සභාවේ තීරණය මත බලය ලබා දෙන නිළධාරියෙකුට හැකියාව ඇත.

24. වෙනත්

බෞද්ධ සංගමය මගින් ක්‍රියාත්මක කරනු ලබන විශේෂ බෞද්ධාගමික වැඩ සටහන් හෝ වියදම් දැරීම සම්බන්ධයෙන් විධායක සභාවේ අනුමැතිය මත සිදු කල හැකි අතර බෞද්ධ සංගමයට අයත් නිවාඩු නිකේතනයන්හි කළමණාකාරවරුන්, සාමාජික නිලධාරීන් අතුරින් අයදුම්පත් කැඳවා තෝරා පත්කර ගත යුතුය.

සංශෝධනය කරන ලද ව්‍යවස්ථාව 2022.07.23 දින පැවති මහා සභා රැස්වීමේදි අනුමත කරන ලදි

ගරු සභාපති,
සීමාසහිත බන්ධනාගාර දෙපාර්තමේන්තු
නිලධාරීන්ගේ බෞද්ධ සමිතිය

ගරු සභාපති
සී.ස. ශ්‍රී ලංකා බන්ධනාගාර දෙපාර්තමේන්තුව
නිළධාරීන්ගේ බෞද්ධ සංගමය
බන්ධනාගාර මූලස්ථානය
කොළඹ - 09

ගරු ලේකම්,
සීමාසහිත බන්ධනාගාර දෙපාර්තමේන්තු
නිලධාරීන්ගේ බෞද්ධ සමිතිය

ගරු ලේකම්
සී/ස. සමස්ත බන්ධනාගාර නිලධාරීන්ගේ බෞද්ධ සංගමය
බන්ධනාගාර මූලස්ථානය
බේස්ලයින් පාර, කොළඹ 09.